# 13. යුක්තිය

හසරත් අලි රළියල්ලාහු අන්හු තුමා හතරවැනි කලීෆාවරයා ය. දිනක් එතුමා ගමනක් යමින් සිටියේ ය. එතුමා සමග පුතා ද සේවකයා ද සිටියේ ය. අතරමඟ දී එතුමාගේ පළිහ නැති විය. මඟ දී හමු වූ යුදෙව්වා එය සොරකම් කරන්නට ඇතැයි සැක කළේ ය. කලීෆාතුමා මේ ගැන උසාවියට පැමිණිලි කළේ ය. විනිශ්චයකරු නඩුව ඇසුවේ ය.

විනිශ්චයකරු: (යුදෙව්වා දෙස බලා) නුඹ, පළිහ සොරකම් කිරීමේ වරදකරුවකු බව කලීෆා පවසයි. සැබෑ ද?

යුදෙව්වා: මම එතුමාගේ පළිහ සොරකම් කළේ නැත.

විනිශ්චයකරු: කලීෆාතුමනි, ඔබට සාක්ෂි තිබෙනවා ද?

කලීෆා: ඔව්, මගේ පුතාත්, සේවකයාත් සාක්ෂි දරති.

විනිශ්චයකරු: තව සාක්ෂි තිබෙනවා ද?

කලීෆා: නැත.

විනිශ්චයකරු: පුතාගේ සහ සේවකයාගේ සාක්ෂි පිළිගත නොහැකි ය. එම නිසා මෙම නඩුව ඉවත දමමි.

මෙය ඇසූ යුදෙව්වා පුදුමයට පත් විය. ඉස්ලාමීය අධිකරණ ක්‍රමයට ප්‍රශංසා කළේ ය. "එතුමා කලීෆාවරයකු වුවත්, විනිශ්චයකරු නඩුව ඉවත් කළේ ය." මෙයට යුදෙව්වා පැහැදී තමාගේ වරද පිළිගත්තේ ය.

## පැවරුම්

**පහත දී ඇති වචන යොදා හිස්තැන් පුරවා අභ්‍යාස පොතේ ලියන්න.**

**සේවකයා, අලි රළියල්ලාහු අන්හු, සාක්ෂි, යුදෙව්වා, පළිහ**

1. ..................... තුමා හතරවැනි කලීෆාවරයා ය.
2. කලීෆා සමග පුතාත් ............................ ත් ගමනේ යෙදුණහ.
3. කලීෆාවරයාගේ නැති වූ දෙය ......................... වේ.
4. නැති වූ දෙය සොරා ගත්තේ ............................ බව කලීෆාවරයා සැක කළේ ය.
5. නිවැරැදි ......................... නොමැති නිසා විනිශ්චයකරු නඩුව ඉවත දැම්මේ ය.